**සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදල - 2018**

---

## 1.1 මතය ව්‍යාචනය

සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, සමුච්චිත අරමුදලේ වෙනස්වීම් සම්බන්ධ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මම මතයක් ප්‍රකාශ නොකරමි. 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, සමුච්චිත අරමුදලේ වෙනස්වීම් සම්බන්ධ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය ව්‍යාචනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගිණුම් තැබීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මකකර නොතිබීම. | අදහස් ඉදිරිපත්කර නොමැත | මූලික උපයෝගී පොත්, උපයෝගී ලේඛන හා ලෙජර් ගිණුම් නිසි ලෙස නඩත්තු කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයන් ක්‍රියාත්මක කළ යුතු වීම. |
| (ආ) විවිධ ව්‍යාපෘති යටතේ ආධාර ලබාදීමේ දී ලද ඉල්ලීම්, ඉටු කරන ලද ඉල්ලීම් ප්‍රතික්ෂේපිත ඉල්ලීම් ආදි කරුණු දැක්වෙන ලේඛන නඩත්තු නොකිරීම. | අදහස් ඉදිරිපත්කර නොමැත | ප්‍රමාණවත් තොරතුරු හෙළිදරව් වන පරිදි ලේඛන නඩත්තු කළ යුතු වීම. |

### 1.5.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම කළමනාකරණයේ වගකීම වේ. එසේ වුවද, අරමුදල විසින් ලෙජර් ගිණුම් පිළියෙල කිරීමේදී ගනුදෙනු හා සිද්ධීන් සිදුවන අවස්ථාවේ දී උපයෝගී ලේඛන පදනම් කර ගනිමින් ලෙජර් ගිණුම් පිළියෙල කිරීම වෙනුවට වර්ෂය අවසානයේ දී බැංකු ප්‍රකාශන හා ගෙවීම් වවුචර් භාවිත කර එක් එක් ගිණුමට අදාළව වර්ෂය තුළ සිදු වූ එක හා සමාන සියලුම ගනුදෙනු සඳහා එක් සටහනක් පමණක් ලෙජරයෙහි සටහන් කර තිබුණි. | මුදල් පොත හා බැංකු සැසඳුම් යාවත්කාලීනව පවත්වාගෙන යන අතර දෛනිකව හෝ මාසිකව ප්‍රධාන ලෙජරයට මාරු කිරීමට ප්‍රමාණවත් ගණුදෙනු සංඛ්‍යාවක් නොමැති බැවින් උපයෝගී පොත්වල ශේෂයන් එක් සටහනක් මඟින් වර්ෂ අවසානයේ ප්‍රධාන ලෙජරයට මාරු කිරීමට කටයුතු කර ඇත. | මූලික උපයෝගී පොත්, උපයෝගී ලේඛන හා ලෙජර් ගිණුම් නිසි ලෙස නඩත්තු කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු වීම. |
| (ආ) 2018 වර්ෂයේ දහම් පාසල් දිනය නිමිති කරගෙන මුද්‍රණය කරන ලද රු.11,250,000 ක් වටිනාකම වූ කොඩි 1,050,000 ක් ශාසනාරක්ෂක බල මණ්ඩල 323 ක් සඳහා බෙදා හැර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී කොඩි අලෙවි ආදායම ලෙස රු.5,711,667 ක් ගිණුම්ගතකර තිබුණද, එයින් රු.3,238,977ක් තහවුරුකර ගැනීම සඳහා කොඩි අලෙවි වාර්තා ඉදිරිපත් නොවීය. තවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොවිකිණි ඉතිරිවූ කොඩි ප්‍රමාණය පිළිබඳ වාර්තා අරමුදල සතු නොවීම හේතුවෙන් ගිණුම්ගත කරන ලද ආදායමෙහි නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය තහවුරු කරගත නොහැකි විය. | වාර්තා ලබා ගැනීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වාදුන්නද මෙම ක්‍රමය ආරම්භ කළ මුල් වර්ෂය වන බැවින් සියලු තොරතුරු ලැබී නොතිබුණි. ඉදිරි වර්ෂවලදී මෙය සාර්ථක වේ යැයි අපේක්ෂා කරමි. | පවත්නා ක්‍රමවේදය යටතේ වාර්තා ගෙන්වා ගැනීමේ කටයුතු විධිමත් කිරීම, අධීක්ෂණ නිලධාරියෙකු පත්කිරීම හා දෙසැම්බර් 31 දිනට ඉතිරි කොඩි ගණනය සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වීම. |
| (ඇ) දහම් සිසු සවිය ශිෂ්‍යාධාර වැඩසටහන යටතේ ශිෂ්‍යාධාර ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,256,900 ක් වැය කර තිබුණු අතර එයින් රු.561,900 ක් සඳහා අදාළ ගෙවීම් ශිෂ්‍යත්වලාභීන්ට ලැබුණු බව තහවුරු කරන වාර්තා ඉදිරිපත් නොවීය. | ඉදිරියේදී සාක්ෂි ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ශිෂ්‍යාධාර ලබාදී යම් නිශ්චිත කාලයක්තුලදී ලේඛන ඉදිරිපත් කරන ලෙස දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන් දැනුවත්කිරිම හා ඒ සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු විධිමත් කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,514,220 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 317,489 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3,831,709 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයේදී බුදු පුත් මාපිය උපහාර භාරයේ ආධාර හා ගොඩනැගිලි ආධාර ලෙස රු.2,300,000 ක් වැයකළද, සමාලෝචිත වර්ෂයේදී එම වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීමත්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වෛද්‍යාධාර රු.2,149,000 කින් අඩුවීමත් මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| විෂයය | 2018 | 2017 | ආදායම(අඩුවීම)/ වැඩිවීම වියදම් (වැඩිවීම)/අඩුවීම | සියයට |
|---|---|---|---|---|
| ---------- | --------- | --------- | -------------------- | --------- |
| | රු.000 | රු.000 | රු.000 | |
| ආදායම | | | | |
| කොඩි ආදායම | 5,712 | 5,442 | 270 | 5 |
| ස්ථාවර තැන්පතු පොළිය | 1,898 | 1,705 | 193 | 11.3 |
| බුදු පුත් මාපිය උපහාර භාරයේ පොළිය | 157 | 667 | (510) | (76.5) |
| ඉතිරිකිරීමේ තැන්පතු පොළිය | 507 | 568 | (61) | (10.7) |
| වියදම් | | | | |
| සිසු සවිය ශිෂ්‍යත්ව ආධාර | 1,257 | 1,675 | 418 | 25 |
| වෛද්‍යාධාර | 153 | 2,302 | 2,149 | (93.4) |
| හදවත් සැත්කම් ආධාර | 2,074 | 1,377 | (697) | (50.6) |
| බුදු පුත් මාපිය උපහාර භාරය | - | 1,250 | 1,250 | 100 |
| වැටුප් | 372 | 194 | (178) | (91.8) |
| රඳවාගැනීමේ බදු | 124 | 100 | (24) | (24) |
| කොඩි මුද්‍රණ වියදම් | 812 | 672 | (140) | (20.8) |
| ගොඩනැගිලි ආධාර | - | 1,050 | 1,050 | 100 |

## 3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවීම්</u>

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනතේ අවශ්‍යතාවයන් ඉටු නොකිරීම.<br>(i) පනතේ 3 ඡේදයේ (අ) සිට (එ) දක්වා අරමුදලේ පොදු පරමාර්ථ 9 ක් දක්වා ඇතත් එහි (ඉ) සහ (ඊ) හි දැක්වෙන පරමාර්ථ 2 හැර අනෙකුත් පරමාර්ථ ඉටුකර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු හා ජංගම ගිණුම්වල රු.37,441,929 ක ශේෂයක් පැවතිය ද, පොදු පරමාර්ථ ඉටුකිරීම සඳහා එම අරමුදල් කාර්යක්ෂමව යෙදවීම කෙරෙහි අරමුදල අවධානය යොමුකර නොතිබුණි. | කොඩි විකිණීමෙන් ලැබෙන මුදලින් සිසු සවිය ශිෂ්‍යත්ව ආධාර, වෛද්‍ය ආධාර, හදවත් සැත්කම් ආධාර හා බුදුපුත් මාපිය උපහාර වැනි කාර්යයන් ඉටුකර ඇත. | අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටුකිරීම සඳහා පවතින ගැටලු හඳුනාගෙන එම ගැටලු නිරාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) පනතේ 6 ඡේදයේ අරමුදලේ සාමාන්‍ය බලතල යටතේ දක්වා ඇති (අ) හා (ඊ) උප ඡේද පරිදි අරමුදලේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් නිළධාරීන් සහ සේවකයන් පත්කිරීම හා සේවයේ යෙදවීම සඳහා කටයුතුකර නොතිබුණි. | පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා දැනට නිලධාරිනියන් දෙදෙනෙක් සේවයේ යොදවා ඇත | ස්ථිර සේවක සංඛ්‍යාවක් අනුමතකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. |

### 3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව සමාලෝචිත වර්ෂය අවසන් වනවිට දිවයිනේ සමස්ත දහම් පාසැල් ශිෂ්‍ය සංඛ්‍යාව මිලියන 2.19 ඉක්මවා තිබුණි. දහම් පාසල් දිනය වෙනුවෙන් අලෙවි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී කොඩි 1,050,000 ක් මුද්‍රණය කර තිබූ අතර ලබාගත හැකිවූ තොරතුරු අනුව එයින් දල වශයෙන් කොඩි 230,603 ක් පමණක් අලෙවිකර තිබුණි. ඒ අනුව දහම් පාසල් දිනය සම්බන්ධයෙන් ප්‍රමාණවත් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අරමුදල පියවර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | 2019 වර්ෂයේදී ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. | දහම් පාසල් දිනය හා කොඩි අලෙවි වැඩසටහන් පිළිබඳ ප්‍රමාණවත් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වීම. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය<br>------------------------ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>---------------------- | නිර්දේශය<br>------------- |
|---|---|---|
| ස්වාමීන් වහන්සේලාගේ දෙමාපියන්ට උපකාර කිරීමේ අරමුණින් "බුදුපුත් මාපිය භාරය" ලෙස අරමුදලක් පිහිටුවා තිබුණද අරමුදලින් අපේක්ෂිත කාර්යයන් ප්‍රමාණවත් පරිදි ඉටු නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලේ ශේෂය රු.7,404,270 ක් දක්වා වර්ධනය වී තිබුණි. | මෙම භාරයෙන් වර්ෂයකට ලැබෙන පොලියෙන් සියලුම අරමුණු වර්ෂයක් තුල ඉටුකර ගැනීම අපහසුය. | අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටු කිරීම සඳහා අරමුදල් කාර්යක්ෂමව යෙදවිය යුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 (ආ) සහ 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව අරමුදලේ අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුව තිබුණද සමාලෝචිත වර්ෂය තුළ එසේ සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශයක් නොමැති බැවින් විගණනයක් සිදුකර නොමැත. | අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවීම සඳහා කටයුතු කිරීම හෝ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයෙන් විගණනය සිදුකළ යුතු වීම. |